04 MAY 1995

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 1995 අංක 5 දරන වරදකරුවන් භාරදීමේ පනත

[සහතිකය සටහන් කළේ 1995 පෙබරවාරි මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 පෙබරවාරි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 75 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

# 1995 අංක 5 දරන වරදකරුවන් භාරදීමේ පනත

[සහතිකය සටහන් කළේ 1995 පෙබරවාරි මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 17/92.

**ශ්‍රී ලංකාවේ දී වරදකට වරදකරුවකු කරනු ලැබූ, යම් නිශ්චිත රටක පුරවැසියකු ඒ රටට භාරදීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද යම් නිශ්චිත රටක දී වරදකට වරදකරු කරනු ලැබූ, ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකු ශ්‍රී ලංකාවට භාරදීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1995 අංක 5 දරන වරදකරුවන් භාරදීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පනත අදාළ කිරීම.

2. මේ පනත ආරම්භ කිරීමට පෙර හෝ පසුව හෝ වුව ද, ශ්‍රී ලංකාව සහ යම් වෙනත් රටක් අතර යම් ගිවිසුමකට එළඹ ඇති අවස්ථාවක, (මේ පනතෙහි "නිශ්චිත රට" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ වෙනත් රට සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ කරනු ලැබිය යුතු යයි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

වරදකරුවකු භාර දෙන ලෙස අයැදිමින් අමාත්‍යවරයා විසින් ඉල්ලීමක් කළ හැකි බව.

3. (1) යම් නිශ්චිත රටක පුරවැසියකු වන හෝ පුරවැසියකු යයි සැක කරනු ලබන යම් වරදකරුවකු ඒ රටට භාරදෙන ලෙස අයැදිමින්, ඒ රටේ උචිත බලධරයා වෙත අමාත්‍යවරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, යම් නිශ්චිත රටක පුරවැසියකු බවට හිමිකම් පාන යම් වරදකරුවකු විසින්, තමා පුරවැසියකු යයි හිමිකම් පාන නිශ්චිත රටට තමා භාර දෙන ලෙසට වූ අයැදීමක් බන්ධනාගාර කොමසාරිස්වරයා මගින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයා විසින්, එවැනි අයැදීමක් කිරීම උචිත යයි තමා සලකන විටක, (1) වන උපවගන්තිය යටතේ ඒ වරදකරු වෙනුවෙන් ඒ නිශ්චිත රටේ උචිත බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ අයැදිමක් සඳහා කරන්නා වූ සෑම ඉල්ලීමක් ම, ඒ කාර්යය සඳහා නියමිත යම් ආකෘතියක සහ යම් ලේඛන සමග ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(4) යම් වරදකරුවකුගේ අයැදීමක් මත, අමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, තමා භාර දෙන ලෙස කරන ලද අයැදීම පිළිබඳව, අමාත්‍යවරයා සහ නිශ්චිත රටේ උචිත බලධරයා යන දෙදෙනා ම විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ගය හෝ තීරණය පිළිබඳව, ඒ වරදකරු වෙත ලියවිල්ලක් මගින් අමාත්‍යවරයා විසින් දැනුම් දිය යුතු ය.

2—ඩී 034377—5,930 (95/01)

නිශ්චිත රටක් විසින් කළ යුතු ඉල්ලීම.

4. (1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් හිමිකම් පාන වරදකරුවකු ශ්‍රී ලංකාවට භාරදීම සම්බන්ධයෙන් යම් නිශ්චිත රටක උචිත බලධරයකු විසින් අමාත්‍යවරයා වෙත කරනු ලබන කිසිම ඉල්ලීමක්—

(අ) ඒ ඉල්ලීම ඒ කාර්යය සඳහා නියමිත ආකෘතියෙහි කරනු ලබන්නේ නම්; සහ

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ වරදකරු බන්ධනාගාරගත කිරීමට නියම කළ ආඥාවේ, තීරණයේ හෝ නඩු තීන්දුවේ පිටපතක්, ඒ නිශ්චිත රටේ උචිත බලධරයා විසින් නිවැරදි බවට සහතික කරනු ලැබ, ඉල්ලීමට යා කරනු ලබන්නේ නම්

මිස, අමාත්‍යවරයා විසින් පිළිගනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීම කවර, නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එකඟ වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමට යා කර ඇති ආඥාවේ, තීරණයේ හෝ නඩු තීන්දුවේ පිටපත, ඒ මගින් ප්‍රකාශිත කරුණු පිළිබඳ සාක්ෂි විය යුතු අතර, එය අවස්ථාවෝචිත පරිදි, නිසි අධිකරණ බලයක් ඇති ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් පනවන ලද ආඥාවක්, තීරණයක් හෝ නඩු තීන්දුවක් වශයෙන් බලපැවැත්විය යුතු ය.

භාරදීමේ කොන්දේසි.

5. මේ පනත යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, යම් වරදකරුවකු භාරදීම, පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතු ය :—

(අ) වරදකරු වෙන යම් රටක පුරවැසියකු විය හැකි වුව ද, එය නොතකා, ඔහු ශ්‍රී ලංකාවේ හෝ නිශ්චිත රටේ පුරවැසියකු වීම ;

(ආ) අවස්ථාවෝචිත පරිදි, වරදකරු වෙත පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය කෙරුණු ආඥාව, තීරණය හෝ නඩු තීන්දුව අවසාන ආඥාවක්, තීරණයක් හෝ නඩු තීන්දුවක් වීම ;

(ඇ) භාරදීම සඳහා වූ ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ දී, වරදකරුට පනවන ලද බන්ධනාගාරගත කිරීමේ කාලයෙන් මාස හයකට වැඩි ප්‍රමාණයක් ඉතිරිව තිබීම හෝ පනවන ලද බන්ධනාගාරගත කිරීමේ කාලය අවිනිශ්චිත කාල සීමාවක් වීම ;

(ඈ) භාරදීම සම්බන්ධයෙන් වරදකරු කැමැත්තක් දක්වීම හෝ වරදකරුගේ වයස හෝ ශාරීරික හෝ මානසික තත්ත්වය හේතුකොට ගෙන ඔහුගේ කැමැත්ත දීමට නොහැකිවන අවස්ථාවක, වරදකරු වෙනුවෙන් කැමැත්ත දීමට අමාත්‍යවරයා විසින් හෝ නිශ්චිත රටක උචිත බලධරයා විසින් හෝ නම් කරනු ලබන වෙනත් යම් තැනැත්තකු විසින් කැමැත්ත දීම ;

(ඉ) අමාත්‍යවරයා සහ නිශ්චිත රටේ උචිත බලධරයා යන දෙදෙනාම විසින් භාරදීම සම්බන්ධයෙන් කැමැත්තක් දැක්වීම.

*අමාත්‍යවරයා විසින් අධිකාර පත්‍රයක් නිකුත් කිරීම.*

**6.** (1) අමාත්‍යවරයා විසින්, උචිත යයි සලකන අවස්ථාවක සහ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් වරදකරුවකු ශ්‍රී ලංකාවෙන් බැහැර යම් නිශ්චිත රටකට භාරදීමට බලය දෙමින් අධිකාර පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබිය යුතු අධිකාර පත්‍රය අමාත්‍යවරයාගේ අත්සන යටතේ වූ නියමිත ආකෘතියෙහි විය යුතු ය.

(3) යම් වරදකරුවකුට අදාළව කරනු ලබන යම් භාරදීමකින් ඇතිවන බලපෑම සහ ප්‍රතිඵල පිළිබඳව, වරදකරුගේම භාෂාවෙන් ලියවිල්ලක් මගින් ඔහු වෙත දැන්වීමට අවශ්‍ය, සියලු සාධාරණ පියවර ගනු ලැබ ඇති බවට අමාත්‍යවරයා සෑහීමට පත්වෙතොත් මිස, ඔහු විසින් (1) වන උපවගන්තිය යටතේ අධිකාර පත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ අධිකාර පත්‍රයක් නිකුත් කිරීමේ දිනයේදී අමාත්‍යවරයා විසින් එහි පිටපතක් බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත භාරදීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රයක් යම් වරදකරුවකු භාර ගැනීමේ බලය ලත් යම් තැනැත්තකු වෙත ඒ වරදකරු භාරයට පත්කිරීම හෝ භාරයට පත්කිරීමට සැලැස්වීම සඳහා බන්ධනාගාර කොමසාරිස්වරයාට ද, ඒ වරදකරු භාරයේ තබා ගැනීම සඳහා ඒ තැනැත්තාට ද, ඒ වරදකරුගේ භාරය ගැනීම පිණිස නිශ්චිත රටේ උචිත බලධරයා විසින් යථා පරිදි බලය දෙන ලද තැනැත්තකුගේ භාරයට වරදකරු පත්කිරීම පිණිස ඒ බලය දෙන ලද ඒ තැනැත්තාට ද, ප්‍රමාණවත් අධිකාරයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

*අධිකාර පත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව, කැමැත්ත ඉල්ලා අස් කර ගත නොහැකි බව.*

**7.** 6 වන වගන්තිය යටතේ අධිකාර පත්‍රයක් නිකුත් කරනු ලැබීමේදී සහ ඉන් පසුව, ඒ අධිකාර පත්‍රය නිකුත් කරන ලද්දේ යම් වරදකරුවකු සම්බන්ධයෙන් ද ඒ වරදකරු විසින් 5 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ දෙන ලද කැමැත්ත ඉල්ලා අස්කරගත නොහැකි වන අතර, දෙන ලද කැමැත්තක් අධිකාර පත්‍රයක් නිකුත් කිරීමෙන් පසුව ඉල්ලා අස්කර ගැනීමේ යම් ක්‍රියාවකින් ඒ අධිකාර පත්‍රයේ වලංගුභාවය සහ ඒ අධිකාර පත්‍රයට අදාළව දෙන ලද විධිවිධාන කිසිවක් කෙරෙහි බලපෑමක් ඇති නොකළ යුතු ය.

*ශ්‍රී ලංකාව වෙත භාර කරන ලද වරදකරුවකු බන්ධනාගාර කොමසාරිස්වරයා විසින් භාරයේ තබාගත හැකි බව.*

**8.** (1) 4 වන වගන්තිය යටතේ වූ නියමයක් මත යම් නිශ්චිත රටකින් ශ්‍රී ලංකාව වෙත භාර කරන ලද සෑම වරදකරුවකුම විධිමත් ලෙස බන්ධනාගාර කොමසාරිස්වරයාගේ භාරයට පත් කළ යුතු අතර, ඒ වරදකරුට ඒ නිශ්චිත රටේදී පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය ශ්‍රී ලංකාවේ අධිකරණයක් මගින් පනවන ලද දණ්ඩන නියමයක් මෙන් සලකා, ඒ දණ්ඩන නියමයේ කාල පරිච්ඡේදය බලාත්මක කිරීමෙහි ලා උචිත යයි තමාට පෙනී යන යම් ස්ථානයක ඒ වරදකරු භාරයේ තබා ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා සතු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකාව වෙත භාර කරන ලද යම් වරදකරුවකුට පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය ක්‍රියාවේ යෙදවීම, ශ්‍රී ලංකාවේ නීතිවලට යටත්ව කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, ගිවිසුමෙහි අන්‍යාකාරයකින් සඳහන් වී ඇත්නම් මිස (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකාව වෙත භාර කරන ලද යම් වරදකරුවකුට පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයේ නෛතික ස්වභාවයෙන් සහ එහි පවත්නා කාලයෙන් අමාත්‍යවරයා බැඳී සිටිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ භාර කරන ලද යම් වරදකරුවකුට පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයේ නෛතික ස්වභාවය සහ පවත්නා කාලය ශ්‍රී ලංකාවේ යම් නීතියකට අනනුකූල වූ අවස්ථාවක ඒ දණ්ඩන නියමය ශ්‍රී ලංකාවේ නීති සමග ගැලපෙන ආකාරයට නිසි අධිකරණ බලය ඇති ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් සකස් කිරීම නීත්‍යානුකූලව විය යුත ය. එසේ වුවද, නිසි අධිකරණ බලය ඇති ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක් විසින් එසේ සකස් කර ගන්නා ලද දණ්ඩන නියමය, ඒ වරදකරු ශ්‍රී ලංකාව වෙත භාර කරන ලද යම් නිශ්චිත රටේ දී එම වරදකරු වෙත පනවන ලද දණ්ඩන නියමයට හැකිතාක් දුරට අනුරූප විය යුතු ය.

අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද යම් අධිකාර පත්‍රයක් බලපෑම.

9. 6 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන අධිකාර පත්‍රයක බලපෑම—

(අ) ශ්‍රී ලංකාව ඇතුළත යම් ස්ථානයකට වරදකරු ගෙන යාම පිණිස සහ ශ්‍රී ලංකාවෙන් පිටතට නික්ම යන යම් ස්ථානයක දී ඒ වරදකරු භාරදෙනු ලබන්නේ යම් නිශ්චිත රටකට ද, ඒ නිශ්චිත රටේ උචිත බලධරයා විසින් ඒ වරදකරුගේ භාරකාරත්වය ගැනීම සඳහා යථා පරිදි බලය දෙන ලද තැනැත්තකුගේ, භාරයට ඒ වරදකරු පත් කිරීම පිණිස : සහ

(ආ) වරදකරු පත් කරන ලද්දේ යම් තැනැත්තකුගේ භාරයට ද ඒ තැනැත්තා විසින් වරදකරු ශ්‍රී ලංකාවෙන් බැහැර වෙනත් යම් ස්ථානයකට ඉවත් කර ගෙන යාම පිණිස,

බලය දීම විය යුතු ය.

භාරයේ සිටින වරදකරුවකු ශ්‍රී ලංකාවේ වෙනත් යම් ස්ථානයකට ඉවත් කර ගෙන යාම.

10. (1) මේ පනතේ 8 වන හෝ 9 වන වගන්ති යටතේ භාරයට පත් කරන ලදව ඒ භාරයෙන් පලා යන යම් වරදකරුවකු, ඔහු කරන ලද වරදක් සම්බන්ධයෙන් එම වරද කරන ලද ස්ථානයේ නිකුත් කරන ලද සිරභාරයට ගැනීමේ අධිකාර පත්‍රයක් යටතේ භාරයට ගැනීමෙන් අනතුරුව එම භාරයෙන් පලායන තැනැත්තකු නැවත සිරභාරයට ගනු ලබන ආකාරයෙන්ම, ශ්‍රී ලංකාවේ කවර ස්ථානයක දී හෝ සිරභාරයට ගනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු මේ පනතේ 8 වන හෝ 9 වන වගන්ති යටතේ භාරයේ සිටියදී, ඔහු භාරයේ තබා සිටින ස්ථානයෙන් ශ්‍රී ලංකාවේ වෙන යම් ස්ථානයකට ගෙන යාමට නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඔහු භාර දීමට නියමිත ස්ථානයට ළඟාවන තුරු, ඔහු අඛණ්ඩව නෛතික භාරයේ සිටින ලෙස සලකනු ලැබිය යුතු ය.

බන්ධනාගාර ආඥාපනත අදාළ කිරීම.

11. මේ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවට හෝ ඉන් බැහැර ව භාර කරන ලද සෑම වරදකරුවකු සම්බන්ධයෙන් ම (54 වන අධිකාරය වූ) බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

ලිහිල් කිරීම සහ සමාව දීම සඳහා වූ ජනාධිපති වරයා සතු බලය.

12. (1) මේ පනතේ 8 වන වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකාව වෙත භාර කරන ලද යම් වරදකරුවකු, ඔහු වරදකරු කරනු ලැබූ නිශ්චිත රටේ දී ඔහු වෙත පනවන ලද දණ්ඩන නියමයේ· ඒ නිශ්චිත රටේ බලාත්මක වන දණ්ඩන නියමයක් ලිහිල් කිරීමට අදාළ නීතියට අනුකූලව ඔහු භාර කළ දින ඔහුට හිමිකම ලැබිය හැකිව තිබූ යම් ලිහිල් කිරීමකට යටත් විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන ව්‍යවස්ථාව යටතේ යම් වරදකරුවකුට සමාව දීමේ හෝ ඔහුට පමුණුවන ලද දණ්ඩන නියම යක් ලිහිල් කිරීමේ ජනාධිපතිවරයා සතු බලය සීමා කරන ලෙස හෝ අවත් කරගන්නා ලෙස මේ පනතේ කිසිවක් තේරුම් නොගත යුතු ය.

ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන වරදකරුවකු වෙත පනවන ලද බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියම යන් සම්බන්ධ යෙන් අභියාචනා යක් හෝ ප්‍රති ශෝධනයක් නොකළ යුතු බව.

13. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් වරදකරුවකු වෙත යම් නිශ්චිත රටක දී පනවන ලද බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියමය, ඒ දණ්ඩන නියමය පැනවීමේ ආඥාව, තීරණය හෝ නඩු තීන්දුව, නිසි අධිකරණ බලය ඇති ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් පනවන ලද ආඥාවක්, තීරණයක් හෝ නඩු තීන්දුවක් වශයෙන් සැලකිය යුත්තේ වුව ද, ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක යම් අභියාචනයකට හෝ ප්‍රතිශෝධනයකට යටත් නොවිය යුතු ය.

නියෝග.

14. (1) නියමිත යයි මේ පනතින් ප්‍රකාශ කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ මේ පනතින් නියෝග සෑදීමට නියම කර ඇති හෝ බලය දී ඇති සියලු කාරණා සඳහා යෝ ඒ සම්බන්ධයෙන් අමාත්‍ය වරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ ඒ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු, හැකි තාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"ගිවිසුම" යන්නෙන් මේ පනත ආරම්භ කිරීමට පෙර හෝ පසුව හෝ වුව ද, ශ්‍රී ලංකාව සහ වෙනත් යම් රටක් අතර අන්‍යෝන්‍ය වශයෙන් වරදකරුවන් භාරයට ගැනීමට අදාළ ව ඒ දෙරට අතර ඇතුළත් වූ යම් ගිවිසුමක් අදහස් වේ;

"උචිත බලධරයා" යන්නෙන්, නිශ්චිත රටක් සම්බන්ධයෙන් වන විට, ඒ නිශ්චිත රටට හෝ රටෙන් වරදකරුවන් භාර කිරීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු බලධරයා වශයෙන් ගිවිසුමේ සඳහන් ඒ නිශ්චිත රටෙහි යම් පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"බන්ධනාගාර කොමසාරිස්වරයා" යන්නෙන්, (54 වන අධිකාරය වූ) බන්ධනාගාර ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ පත් කරන ලද බන්ධනාගාර සහ පරිවාස සේවා කොමසාරිස්වරයා වශයෙන් තත්කාලයේ ධුරය දරන තැනැත්තා අදහස් වේ;

"වරදකරු" යන්නෙන්, මේ පනත ආරම්භවීමට පෙර හෝ පසුව, කරන ලද වරදකට වරදකරු වූ ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක් විසින් හෝ යම් නිශ්චිත රටක අධිකරණයක් විසින් හෝ එම නිශ්චිත රටෙහි යම් ආඥාකිරීම සඳහා බලය දී ඇති අධිකරණ බලතල ක්‍රියාත්මක කරනු ලබන වෙනත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ආඥාවක් ප්‍රකාර තත්කාලයේ බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියමයක් ගත කරන්නා වූ තැනැත්තකු අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි.
අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන
(විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ
එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.